08/08/2010 - ඉරිදා ලංකාදීප

**ජෙනිංග්ස් ගැන නොදන්නා තරුණ පරපුර හා ව්‍යවස්ථා සංශෝධනය - මිලින්ද මොරගොඩ**

2007 අවුරුද්දේ අග භාගයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිසුන් කණ්ඩායමක් එහි ශාලාවක් ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් (Sir Ivor Jennings) නමින් යළි නම් කිරීමට එකහෙලා විරුද්ධ විය. කවුද මේ ජෙනිංග්ස් යන ප්‍රශ්නය ඇසූ වැඩි දෙනෙක් පේරාදෙණිය විශ්ව විද්‍යාලය ආරම්භක උප කුළපති හා ශ්‍රී ලංකාවට නිදහස ලබන පළමු ව්‍යවස්ථාව සම්පාදනයට උපදේශකයා වශයෙන් ක්‍රියා කළේ එතුමන් බව දැන සිටියේ නැත. ශ්‍රී ලංකාවේ ජාතියේ නියමුවන් සමග එකතුවී රටට ගැලපෙන ලෙස සෝල්බරි ව්‍යවස්ථාව සම්පාදනය කිරීමෙන් පසු කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ උපකුලපති වශයෙන් පත්ව ගිය බව එම පිරිස කෙසේවත් නොදන්නා වග නිසැකය.

බ්‍රිතාන්‍ය පාලකයන් ලංකාවට නිදහස ලබාදෙමින් රට පාලනය කළ යුතු ආකාරය දක්වන රාමුවක් ඉදිරිපත් කළේය. එය ව්‍යවස්ථාවයි. යටත් විජිත බවින් නිදහස ලැබූ සෑම රටක්ම තමන්ට ආවේනික ව්‍යවස්ථාවක් සකස් කර ගත්හ. පෙර අපර දෙදිගම මෙම ව්‍යවස්ථා සම්පාදකයන් සැලකෙන්නේ ජාතියේ පියවරුන් ලෙසය. තවත් දශක කිහිපයකට පසු ඩී. එස්. කවුද? එස්. ඩබ්. ආර්. ඩී කවර පුද්ගලයෙකු ද හෝ පොන්නම්බලම් රාමනාදන්, ටී. බී. ජායා කවුද යනුවෙන් විමසන සමාජයක් බිහිවුවහොත් එය පුදුමයක් නොවේ. ශ්‍රී ලංකාව අලුත් ව්‍යවස්ථාවක් ඉල්ලා සිටින්නේ මේ අතීත අරුමය සාහසික අන්දමට අමතක කරමින්යැයි චෝදනා කිරීම යුක්ති සහගතය.

ප්‍රජාතන්ත්‍රවාදයට අනුව ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන ආයතනවල සිදුවන බලතුළනය මගින් මහජනතාවට සමාන අයිතිවාසිකම් හිමි කරයි. ජනමාධ්‍ය සිව්වැනි ආයතනය වශයෙන් සිවිල් සමාජයේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියි. දේශීය හා ජාත්‍යන්තර සිවිල් සංවිධාන ද එයට ශක්තියක් සපයයි. ලෝකයේ ඇතැම් රටවල මාධ්‍ය හා සිවිල් සංවිධාන ආණ්ඩුවලට වඩා බලවත්ය. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය සම්බන්ධ නිල ප්‍රමිතීන් නැත. එහෙත් වැදගත් වන්නේ සමාජය විසින් ක්‍රමය පිළිගැනීමයි.

ප්‍රජාතන්ත්‍රවාදය විවිධ සංස්කෘති හා සමාජ රටාවන්ට අයත් ජන කණ්ඩායම් මුහුණදුන් අභියෝගවල ප්‍රතිඵලයකි. බ්‍රිතාන්‍ය තුළ ප්‍රජාතන්ත්‍රවාද මූලික ලක්ෂණ බිහිවූයේ John රජු හා English Barons වරු අතර ඇතිවූ බලඅරගලය සමගය. රජු නිතර අවට රාජ්‍ය සමග යුධ ගැටුම් ඇති කරගත් අතර බ්‍රිතාන්‍ය හමුදාව නඩත්තු කළ රදළ බැරන්වරුන්ට එය දරාගත නොහැකි විය. හමුදාව සමන්විත වූයේ රදළයන්ගෙන් නිසා එකී පවුල්වලට යුද්ධ හෙයින් සිදුවූ ජීවිතහානි බරපතලය. රදළයන් රජුට එරෙහිව කැරැල්ලක් මෙහෙයවීය. එය අවසන් වූයේ රජු හා රදළයන් අතර වසර 1215 දී ගිවිසුමක් අත්සන් කිරීමෙනි. එය මැග්නාකාර්ටා Magna Carta ගිවිසුමයි. ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ මුල් අදහස නිශ්චිතව දැක්වෙන පළමු ඓතිහාසික ලියැවිල්ල ලෙස මෙය ඉතිහාසයට එක්ව තිබේ.

ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය බිහිවූයේ එරට අලුත් සමාජයක් බිහිවන අවස්ථාවේදීය. නිරස පාලන ක්‍රමවලින් පීඩාවට පත්ව නිවහල් අවස්ථා සොයා විවිධ රටවලින් ඇමරිකාවට ගිය කණ්ඩායම් තම අයිතිවාසිකම් පදනම් කරගත් අනන්‍ය පිළිවෙතක් සකස් කර ගැනීමට උනන්දුවූහ. එවැනි පරිවර්තනයකට අවධානය යොමු වූයේ තම නියෝජනයක් රහිතව බදු පමණක් අයකරගනිමින් බ්‍රිතාන්‍යය කරන පාලනය ප්‍රතික්ෂේප කිරීම සමගය. No Taxation without Representation යන්න ඔවුන්ගේ ඒකමතික අදහස විය. මිනිස් නිදහසට හා අයිතිවාසිකම් වලට මුල්තැන දෙමින් එරට ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප සකස් වූ අතර Bill of Rights යනුවෙන් ඔවුන් සකස් කරගත් කරුණු දහයකින් සමන්විත රාමුව ව්‍යවස්ථාවට මූලික එයයි.

බලතල හා මහජන සුබසිද්ධිය සම්බන්ධව ගත යුතු පිළිවෙල ඇමරිකානු ව්‍යවස්ථාවේ ලිඛිතව දක්වා තිබීම විශේෂත්වයකි. ආගම් ඇදහීමේ නිදහස, කතා කිරීමේ හා ලිවීමේ නිදහස එහි මූලික දේ විය. ඇමරිකාවේ පිල්ඩෙල්ෆියාවට (Philadelphia) එකතුවූ බුද්ධිමත් සමාජය ඇමරිකාවට ව්‍යවස්ථාවක් සම්පාදනය කළහ. හත්දෙනෙකුගෙන් සමන්විතව, විවිධ තර්ක විතර්ක මැද එකතු වී ව්‍යවස්ථාව සම්පාදනය කළ කණ්ඩායමට ඇමරිකාවේ වර්තමාන පරපුර අදත් ජාතියේ පියවරුන් ලෙස බුහුමන්

දක්වති. ඇමරිකන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සාමාජිකයන්ව සිටි තෝමස් ජෙෆර්සන් හා බෙන්ජමින් ප්‍රැන්ක්ලින් පසුව ප්‍රංශයේ තානාපතිධුර හෙබවූ අතර ඇමරිකාවේ නිදහස තහවුරුවීම පසුව ප්‍රංශ විප්ලවයට සංකේතයක් ද විය. බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ රටවල් වලට ප්‍රජාතන්ත්‍රවාදය හා ව්‍යවස්ථාව සම්බන්ධ අදහස් ව්‍යාප්ත වූ අතර එක් එක් රටවල් තමන්ට අනන්‍ය හා තම සංස්කෘතියට ගැලපෙන පරිදි ව්‍යවස්ථාව සකස් කර ගත්හ.

වර්තමාන ශ්‍රී ලංකාව භුක්ති විඳින්නේ සම්ප්‍රදාය මත පාලනයවන බ්‍රිතාන්‍යයෙන් ලබාදුන් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම්කරගත් මිශ්‍ර ක්‍රමයකි. ඇමරිකානු නිදහස් ආකල්ප පමණක් නොව ප්‍රංශයේ විධායක ජනාධිපති ක්‍රමයත් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට ඇතුලත්ය. විධායක ක්‍රමය මෙරට ව්‍යවස්ථාවට ඇතුලත් කරන ලද නමුත් ව්‍යවස්ථාදායකය හා විධායකය අතර වෙනස ඇති කර නැත. එයට හේතුව වූයේ විධායකයට ඇතුලත්වන ඇමතිධුර ලබන කණ්ඩායම ව්‍යවස්ථාදායකය හොබවන මන්ත්‍රීධුරයෙන් ඉවත්වන්නට අකමැතිවීමය. ඒ හෙයින් මෙරට පවතින ව්‍යවස්ථාව එකිනෙකට වෙනස් විවිධ ලක්ෂණ ඇතුලත් එකකි.

නිදහස ලබා දශක හයකට වැඩි කාලයක් ගතව ඇත. ඡන්ද බලය 1931 සිට තිබිණ. නමුත් රට තුළ පුද්ගල නිදහස ආරක්ෂා වී නැති බවට චෝදනා නැගේ. නිදහසේ ලියන්නට, කියන්නට හා සමාන අවස්ථාවන් නැති බවට විවේචන තිබේ. බලය බෙදීමක් මගින් මහජන අවශ්‍යතා ඉටු කළ යුතු බවට කියැවේ. පාලනයට සම්බන්ධවී සිටින මහජන නියෝජිතයන් පමණක් නොව විරුද්ධ දේශපාලන පක්ෂ ද මෙම පාලන ක්‍රමය ගැන සතුටු නැත. මහජනතාව පත්කරන නියෝජිතයන් අවසානයේ කිසිවෙකුට වගකියන්නේ නැති තත්ත්වයකට පත් කර ඇත්තේ ද මෙම ක්‍රමය විසින්ය. දරුවෙකු පාසලට ඇතුලත් කර ගැනීමේ සිට මහජනතාවගේ සියලු උවමනා එපාකම් සපුරාගැනීමට දේශපාලනය මැදිහත්වන පිළිවෙලක් මේ රටේ දැකගත හැකිය. ව්‍යවස්ථාව, විධායකය හා අධිකරණය අතර ස්වාධීනත්වය අනුව බලතුළනයකින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙතැයි අපේක්ෂා කළත් එය එසේ වන බවට සමාජයේ පිළිගැනීමක් ද නැත. බලය විමධ්‍යගත කරන ලෙස විවිධ ජාතීන් ඉල්ලා සිටියි. හදිසි නීතිය හා ත්‍රස්තවාදය වැලැක්වීමේ පණත වැනි ප්‍රජාතන්ත්‍රවාදය අඩු නීති යටතේ යුධමය කාලපරිච්ඡේදයේ දී පැවති නමුත් දැන් මහජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ගැන විමසිලිමත් වෙති.

විවිධ අවස්ථාවල කරන ලද සංශෝධන නිසා රටට අද ඉතිරිවී ඇත්තේ රටවැසියන් ගේ සැලකිල්ලට පාත්‍රනොවූ, එහි නිර්මාතෘත්වය ගැන සමාජය නොදන්නා ව්‍යවස්ථාවකි. එපමණක් නොවේ. එය යළිත් සංශෝධනයවන බව කීවත් එහි තමන්ට ඇති ප්‍රයෝජනය කුමක්ද්‍රියි මහජනතාව නොදනී. මේ ව්‍යවස්ථාව හා පාලකයන් ආරක්ෂා වී ඇත්තේ කළින් කළට සිදුවන තරුණන්ගේ රුධිර පූජා සමග බව අමතක කළයුතු නැත. ව්‍යවස්ථාවෙන් සමාජයට සාධාරණ අවස්ථා ඇති කළේනම් විජේවීර පමණක් නොව ප්‍රභාකරන් වැනි චරිත බිහිවන්නේ නැත. පාලන ක්‍රමය අසාධාරණ බව 1971 දීත්, 1987 දී දකුණෙන් පමණක් නොව වසර තිහක් දක්වා දිගහැරුණු උතුරේ බිහිසුණු ත්‍රස්තවාදයත් ඉඟිකර ඇත. මෙම කැරලිවලට උරදුන්නේ වරප්‍රසාද නොලත් පෙලැන්තියේ අහිංසක දුප්පතුන්ය. එම පැලැන්තියෙන්ම හමුදාවට එක්වූ තරුණන් ලවා එම කැරළි මර්දනය කළෝය. මේ ගලා ගියේ වරප්‍රසාද නොලත් පැලැන්තියේ රුධිරයයි. අතලොස්සකට පමණක් දේශපාලන බලපෑම්මත සියලු අවස්ථා ඇති කරන මෙම රාමුව වෙනස් කළයුතු බව මෙම අරගල විසින් අවධාරණය ලදී. එය අප නිවැරදිව වටහාගෙන තිබේද?

නිදහස සමග 1948 දී උරුම වූයේ බ්‍රිතාන්‍ය ක්‍රමයට අනුරූප, සෙනෙට් සභාවක් ද සහිත ව්‍යවස්ථාවකි. පසුව 1972 දී ජනරජ ව්‍යවස්ථාවක් බවටත්, 1978 දී එය විධායක ක්‍රමයක් බවටත් පත්විය. ඉනික්බිතිව එයට අවස්ථා දහහතක දී සංශෝධනය වී තිබේ. බොහෝවිට ව්‍යවස්ථාව සංශෝධනයවී ඇත්තේ පටු අවස්ථාවාදී අදහස් අනුවය. එක් පක්ෂයක් හැරදා පැමිණෙන නියෝජිතයන්ගේ තනතුර ආරක්ෂා කරන්නට ව්‍යවස්ථාව සංශෝධනයවී ඇත. දහතුන් වැනි ව්‍යවස්ථාව සංශෝධනය වූයේ ඉන්දියාවේ අවශ්‍යතාවය අනුවය. යහපත් දේ එකතු නොවුනා නොවේ. බලයට පත්වන ආණ්ඩු තම පැවැත්ම ආරක්ෂා කරගන්නට උවමනා තීරණ ගත හැකි මෙවලමක් වශයෙන් ව්‍යවස්ථාව පාවිච්චි කළා විනා එයින් මහජන නිදහස හෝ අයිතිවාසිකම් තහවුරු කළේ නැත. බලය ඇති පක්ෂය ආරක්ෂා කර ගැනීම එහි සිදුවූ සංශෝධනවල යටි අරමුණ බව පැහැදිලිය.

බ්‍රිතාන්‍යයේ, ඇමරිකාවේ, ප්‍රංශයේ හෝ අසල්වැසි ඉන්දියාවේ ව්‍යවස්ථාව නිර්මාණයවූයේ දීර්ඝ වශයෙන් මහජනතාවට බලපාන කරුණු සලකා බැලීමෙන් පසුවය. ශ්‍රී ලාංකික සමාජයේ ව්‍යවස්ථා සම්පාදකයන් පුලුල් දර්ශනයක් ඇතිව එයට සහභාගී වූයේ නැත. රටවැසියන් ශ්‍රී ලාංකිකයන් ලෙස එකමුතු කරන්නට ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සමත්ව නැත. ජාති හා ආගම් වශයෙන් සමාජය සාහසික ලෙස බෙදා තිබේ. කුලය, පෙලැන්තිය හා සමාජ පසුබිම දේශපාලන පක්ෂය අධ්‍යාපනය ලබන පාසල අනුව සමාජය බෙදී තිබේ. මේ බෙදුණු සමාජය විසින් මහජනතාවගේ සමාන අයිතිවාසිකම් හා නිදහස සහමුලින්ම නොතකා නොසලකා හැර ඇත. මේ නිසා සිංහල, දෙමළ හා මුස්ලිම් අන්තවාදය බිහිවී ඇත. බ්‍රිතාන්‍ය මානසික වහල් බව අනුව යමින් ලාංකික සමාජය, ඉංග්‍රීසි කතාකරන හා නොකරන වශයෙන් පටු අන්දමට වෙන්වී ඇත. පුද්ගලයාගේ දක්ෂතාවය හෝ හැකියාවට සාධාරණ අවස්ථා හිමි නොවන බව පැහැදිලි මෙවැනි ස්වභාවයකින් ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම් ගුණාංග ආරක්ෂා වී ඇතැයි අපේක්ෂා කළ හැකිද? ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝගය නම් පවතින පාලන ක්‍රමය සංශෝධන සහිතව කරගෙන යනවාද නැතිනම් සමාජය ඉල්ලා සිටින අලුත් ව්‍යවස්ථාවක් බිහිකරනවා ද යන්නය.

ලෝකයේ පාලන ක්‍රම අනුව ප්‍රගතිශීලීත්වය හරහා අධිපතිවාදීන් බිහිවී තිබේ. විධායක ජනාධිපතිවරුන්ගෙන් අපේක්ෂා නොකරන තරමට ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ආරක්ෂා කළ අවස්ථා ඇත. ශ්‍රී ලංකාවේ ද තත්ත්වයත් එයයි. විධායක බලය නොතිබුණා නම් ආර්ථික හා යුධ අර්බුදවලට මුහුණදීම පහසු නැත. අවස්ථාවාදී පාලනය හා පක්ෂයක බලය තහවුරු කරන වැඩ පිළිවෙල වෙනුවට මහජනතාව ගැන සිතන පුලුල් ව්‍යවස්ථා සංශෝධනයක් කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍යය. එහෙත් අද එවැනි සම්පූර්ණ සංශෝධනයක් කරන්නට ඇති අවස්ථාව ඉතාම අඩුය. එක පැත්තකින් ජනාධිපතිවරයාගේ දෙවන ධුරකාලය අවසන්වෙමින් තිබීම නිසා පක්ෂ විපක්ෂ හැමදෙනෙකුම උත්සාහ කරන්නේ තමන්ට බලයට පැමිණීමට හැකි න්‍යාය පත්‍රය මෙම ව්‍යවස්ථා සංශෝධනය හරහා කරගන්නට යාමය. අවසානයේදී සිදුවන්නේ දේශපාලන කුමන්ත්‍රණයක් පමණකි. එයට ඉඩ දිය යුතුද?

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සතුව විශාල ජනතා ප්‍රසාදයක් තිබේ. එය දේශපාලන ප්‍රාග්ධනයකි. මහජනතාවගේ කැමැත්ත හා ඔහු විසින් ක්‍රියාකළ ආකාරය එයට පසුබිම සකසා ඇත. මෙම ප්‍රාග්ධනය රට වෙනුවෙන් හා රටේ ස්ථාවර සංවර්ධනයක් වෙනුවෙන් නිවැරදි මොහොතේ ආයෝජනය කළ යුතුය. සම්පූර්ණ ව්‍යවස්ථා සංශෝධනය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදයේ ගුණාංග ආරක්ෂා කරන ඵලදායී සංශෝධන ගෙන එන්නට උනන්දු විය යුතුය. ව්‍යවස්ථා සංශෝධනය පුලුල් එකකි. එවැනි විශාල එක දෙයකට පමණක් අවධානය යොමු කළ හොත් සිදුවන්නේ රටේ විසඳාගත යුතු ප්‍රශ්න අමතක කර යළි පටු අරමුණු අනුව ගැටුමට ඇතුල් වීම පමණකි. අතීතයේ සිදුවූයේ එයයි. එයින් සමාජයට සිදුවිය හැකි හානිය බරපතලය.

දේශපාලනඥයන් විසින් ව්‍යවස්ථාව නිර්මාණය කර අයිතිවාසිකම් ප්‍රදානය කරනු ඇතැයි සිතන්නේ නම් එය ද මුලාවකි. බුද්ධිමතුන් හා සිවිල් සමාජය මේ වෙනුවෙන් ඉදිරිපත්වීම වැදගත්ය. ව්‍යවස්ථාව අයිති මහජනතාවටය. දේශපාලනඥයන් පමණක් එහි අඩුපාඩු සකස් කරන්නට සම්බන්ධවීම ද සුදුසු නැත. සමාජය තමන්ට අවශ්‍ය දේ ඉල්ලා සිටින හා ඒ වෙනුවෙන් සංවාදයකට ඉඩ දෙන මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම අද ඇති තවත් වගකීමකි.

මේ අවස්ථාවේ දී සම්පූර්ණ ව්‍යවස්ථා සංශෝධනය පසෙක තබා රට මුහුණ දී ඇති ප්‍රධාණ කරුණු දෙකක් සාර්ථකව දිනා ගැනීමට සම්පූර්ණ ශක්තිය යෙදවිය හැකිය. ආර්ථිකය නැංවීම පළමු කාරණාවයි. ආර්ථිකය ප්‍රතිසංස්කරණය කිරීම හා අනන්‍යතාවය ආරක්ෂා කරගෙන මෙරට ආර්ථිකය ජාත්‍යන්තරයට විවෘත කරන රටවල් අතර ගිවිසුම් වලට නිර්භීතව ඇතුලුවීම එහිලා වැදගත්ය. දෙවැන්න ජාතික එකමුතුකම ඇතිකිරීමයි. ඒ වෙනුවෙන් වැදගත්වන නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කරන අලුත් සංශෝධන ව්‍යවස්ථාවට ආ හැකිය. යුධ පසුබිමකට පසු ජාතීන් අතර විශ්වාසය ගොඩනගන යෝජනා ඒ අතර තිබිය හැකිය. මේවා කළ හැක්කේ දූරදර්ශීව ක්‍රියා කිරීමෙන්ය.

මහජනතාවගේ නොසැලකිල්ලට නොව ඔවුන්ගේ අවධානයට ලක්වන රටේ ප්‍රධාන ලියැවිල්ල බවට ව්‍යවස්ථාව පත්කළ හැක්කේ එය මහජනතාව වෙනුවෙන් බව පෙන්නවන්නට පාලකයන් සමත්වුවහොත් පමණකි. නිදහස ලබා ගැනීමෙන් පසු රටට අවශ්‍ය සම්ප්‍රදායයන් හා මිශ්‍ර කර ලිඛිත රාමුවක් සකස් කරගන්නට අප අපොහොසත් විය. අද එම කෝණයෙන් බලා මූලික රාමුව සකස්කරගත හොත් එයින් පෝෂණයවන වත්මන් පරපුර අනාගතයේ දී බුද්ධිමත්ව සිතා බලා රටේ ව්‍යවස්ථාව සකස් කරනු ඇත. තරුණ පරපුර ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් පමණක් නොව ව්‍යවස්ථාවේ ඇත්තේ මොනවාද්‍රියි කියා දන්නේ නැත. ව්‍යවස්ථාව යනු රටේ පුරවැසියන් ගරු කරන එහි මූලික කරුණු පාසල් දරුවන් පවා දන්නා පාරිශුද්ධ ලියැවිල්ලක් බවට යළි පත් කළ යුතුය. එය කළ හැකි වන්නේ සමාජය තුළ අලුත් ව්‍යවස්ථාවක් ගැන සංවාදයක් ආරම්භ කර එහි සියුම් කරුණු කාරණා විවාද කර අවසන් තීන්දුවකට එළැඹීමෙන් පසු පමණකි. දැනට රට තුළ ප්‍රබල අවශ්‍යතාවයක්ව පැන නැගී ඇත්තේ වැඩි බලයක් ඇති අවස්ථාවේ රට ගොඩනගන හා රට එකමුතු කරන ව්‍යායාමයක් ඇතිකළ යුතුය යන හැඟීම පමණකි. එයට අදාල මූලික කරුණු ව්‍යවස්ථා සංශෝධනයකින් කළ හැකි අතර සමස්ථ ව්‍යවස්ථාව ගැන වඩා පුලුල්ව අවධානය යොමු කිරීම වැදගත්ය.